# ඒකකය 1- අයිතිවාසිකම් භුක්ති විඳිමින් යුතුකම් හා වගකීම් ඉටු කරමු

1) පාසලේ සාමාජිකයකු වශයෙන් ඔබට හිමිවන අයිතිවාසිකම් සඳහන් කරන්න.

- අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය
- තම දක්ෂතා සංවර්ධනය කර ගැනීමට ඇති අයිතිය
- ආරක්ෂා සහිතව සිටීමට ඇති අයිතිය
- සමාන ලෙස සැලකුම් ලැබීමට ඇති අයිතිය
- තම අදහස් ප්‍රකාශ කිරීමට ඇති අයිතිය

2) ශිෂ්‍යයෙකු ලෙස ඔබේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට රජය මගින් සපයා ඇති පහසුකම් මොනවාද ?

- නොමිලේ අධ්‍යාපනය ලබා දීම
- නොමිලේ පාසල් පෙළපොත් ලබා දීම
- නොමිලේ පාසල් නිල ඇඳුම් රෙදි ලබාදීම
- විද්‍යාගාර පහසුකම් සැපයීම
- ක්‍රීඩා උපකරණ සැපයීම
- පුස්තකාල පහසුකම් සැපයීම

3) අයිතිවාසිකම් ලෙස අදහස් වන්නේ කුමක්ද ?

- සමාජය මගින් පුද්ගලයාට ලැබී ඇති වරප්‍රසාද

## ඒකකය 1- ගුරු මණ්ඩලය හා ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතර අන්‍යෝන්‍ය යුතුකම් ඉටු කිරීම

1) ගුරුවරුන් වෙනුවෙන් ඔබෙන් ඉටුවිය යුතු යුතුකම් මොනවාද ?

- හොඳින් ඉගෙනීමේ කටයුතුවල යෙදීම
- අවශ්‍ය අවස්ථාවල උදව් කිරීම හා සහය වීම
- ගුරු අවවාද අනුශාසනා පිළිගෙන කටයුතු කිරීම
- ආචාරශීලී වීම

2) ගුරුවරුන් විසින් ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් ඉටුකරන යුතුකම් සඳහන් කරන්න.

- සිසුන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දීම සඳහා කැපවීමෙන් කටයුතු කිරීම
- සිසුන් සියලු දෙනා යහපත් දරුවන් බවට පත් කිරීම
- සිසුන්ට අවශ්‍ය ආරක්ෂාව හා රැකවරණය ලබා දීම

# ඒකකය 1- 1.8 පාසල හා සමාජය අතර සබැඳියාව

1) පාසලෙන් සමාජයට සැපයෙන සේවා මොනවාද ?

- යහපත් පුරවැසියන් බිහිකිරීම
- ජනතාවගේ සාක්ෂරතාවය වැඩිදියුණු කිරීම
- අනාගත නායකයන් පුහුණු කිරීම
- දරුවන්ට අධ්‍යාපනය ලබා දී යහපත් ජීවිතයක් ගත කිරීමට මග පෙන්වීම

2) පාසල මගින් අවට ප්‍රජාවට ලබාදෙන පණිවිඩ මොනවාද ?

- දරුවන් පාසල් යැවීමේ වැදගත්කම
- යහපත් සෞඛ්‍ය පුරුදුවලට හුරු කිරීම
- පරිසරය රැක ගැනීමේ වැදගත්කම

3) සමාජයෙන් පාසලට සැලසෙන සේවා සඳහන් කරන්න.

- පාසලේ සංවර්ධන කටයුතුවලට සහාය වීම
- පාසල සතු දේපල ආරක්ෂා කිරීම
- පාසල අවට සමාජයේ ඇති විවිධ සංවිධානවලින් පාසලට අවශ්‍ය සේවා ලබා ගැනීම

4) පාසල් සංවර්ධන කමිටුවේ සාමාජිකයන් නම් කරන්න.

- දෙමාපිය නියෝජිතයන්
- ආදි ශිෂ්‍ය නියෝජිතයන්
- ආචාර්ය මණ්ඩලයේ නියෝජිතයන්
- කලාප අධ්‍යාපන කාර්යාලයේ නියෝජිතයෙකු

5) "ළමා හිතෛෂී පාසලක්" හෙවත් ළමා මිතුරු පාසලක් යනුවෙන් අදහස් වන්නේ කුමක්ද ?

- රැකවරණය සහිත වාතාවරණයක සුරක්ෂිත වූ පවිත්‍ර පරිසරයක , සෞඛ්‍යාරක්ෂිත පහසුකම් ඇති පාසල

6) ළමා මිතුරු පාසල් පරිසරයක දැකිය හැකි ලක්ෂණ මොනවාද ?

- ජලය හා සෞඛ්‍යාරක්ෂිත පහසුකම් සපයා ඇත
- සුරක්ෂිත වූ ඉගෙනුම් පරිසරයක් තිබීම
- ප්‍රබෝධමත් වූ පන්ති කාමර පරිසරයක් තිබීම